*සැ. යු.*– 2007.09.07 වැනි දින පළකරන ලද 1,514 දරන *ගැසට් පත්‍රයෙහි* II සහ IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,515 - 2007 සැප්තැම්බර් 14 වැනි සිකුරාදා - 2007.09.14

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ජෙදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1026 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1027 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1028 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1031 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1007 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1036 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 සැප්තැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහ රෝහල - වවුනියාව

2008 වර්ෂය සඳහා මෙම රෝහලට අවශ්‍ය සේවයන්

2007 දෙසැම්බර් මස 21 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 20 වැනිදායින් (දින දෙකම ඇතුළුව) අවසාන වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් සේවයන් සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර වවුනියාව මහ රෝහලේ වෛද්‍ය අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

01. සේවාවන්ගේ විස්තර හා තැන්පත් මුදල් පහත දැක්වේ.

| *අනු අංකය* | *විස්තර* | *ටෙන්ඩර් තැන්පතු මුදල් (ආපසු නොගෙවන)* | *ටෙන්ඩර් තැන්පත් මුදල (ආපසු ගෙවන)* | *තිබිය යුතු වත්කමේ වටිනාකම* |
|---|---|---|---|---|
| ඒ | ආහාර සැපයීම (අමු ආහාර ද්‍රව්‍ය) | 1,000 | 50,000 | 2,50,000 |
| බී | කිළිටි රෙදි සේදීම | | | |
| | I කොටස | 500 | 15,000 | 75,000 |
| | II කොටස | 500 | 15,000 | 50,000 |
| සී | ආරක්ෂක අංශය | 1,000 | 50,000 | |
| ඩී | ක්ලීනින් සේවය | 1,000 | 50,000 | |
| ඊ | පරිගණක අලුත්වැඩියා කිරීම | 500 | 10,000 | |
| එෆ් | වායුසමන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 1,000 | 15,000 | |
| ජී | ශීතකරණ අළුත්වැඩියා කිරීම මෘත ශරීරාගාරය | 1,000 | 5,000 | |
| එච් | විදුලි සෝපානය | 2,000 | 25,000 | |

02. *වත්කම් විස්තර.*– 2007.09.15 න් පසු දිස්ත්‍රික් ලේකම්ගෙන් වත්කම් පිළිබඳ ගන්නා ලද විස්තර (පොදු 170 ඒ බී ට පමණක්) ලබා දිය යුතුයි. නැතහොත් බැංකුව මගින් ලබා ගන්නා මුදල් වත්කම් ප්‍රකාශයක් ලබාගත යුතුයි. මීට පෙර මෙම රෝහලේ සේවයන් පවත්වාගෙන යන ටෙන්ඩර් කරුවන්ද මෙම වත්කම් ප්‍රකාශය ලබාගත යුතුයි.

03. *තැන්පතු පිළිබඳ විස්තර.*– ඉහත සඳහන් කරන ලද මුදල් වවුනියාව මහ රෝහලේ මුදල් අංශයට ගෙවා මුදල් කුවිතාන්සි ලබා ගත හැක. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු ටෙන්ඩර් සඳහා සුදුසුකම් නොලැබූ අයගේ ගෙවන ලද මුදල් ආපසු ලබා ගැනීමට පුළුවන.

04. *ටෙන්ඩර් ලියාපදිංචි කිරීමේ විස්තර.*– මෙම ටෙන්ඩර් භාර දීමේ දී ඔබගේ ටෙන්ඩර් සම්බන්ධ ලියාපදිංචි සහතිකපත් ඉදිරිපත් කළ යුතුයි.

05. *පළපුරුද්ද පිළිබඳ සහතිකය.*– පසුගිය කාලයේදී ඔබ ලද පළපුරුදු පිළිබඳ සහතික ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුයි. ආරක්ෂක සේවය සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර් කරුවන් විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අනුමැති සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

06. *බදු .*– දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති රෙගුලාසි අනුව ගෙවිය යුතු බදු හා එහි ගෙවීම් සියලු දේ කොන්ත්‍රාත්කරු විසින් ගෙවීමට බැඳිය යුතුය.

07. *ටෙන්ඩර් පත්‍ර.*– ටෙන්ඩර් පත් 2007.09.29 දහවල් 12.00 දක්වා වවුනියාව මහ රෝහලේ මුදල් අංශයෙන් රාජකාරි වේලාවන්හිදී ලබාගත හැක. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුයි.

08. *ටෙන්ඩර් පත් එවිය යුතු අන්දම.* – සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයේ බහා "වෛද්‍ය අධිකාරී, මහ රෝහල. වවුනියාව" යන ලිපිනයට එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවකට ද කවර අංශයක් වෙත ද පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ කෙලින් ම ගෙනවිත් භාරදිය හැකිය. සෑම ටෙන්ඩරයක් සඳහාම වෙන වෙනම ටෙන්ඩර්පත් එවිය යුතුය.

09. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය.– 2007.10.01 පෙ. ව. 9.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

10. *ටෙන්ඩර්පත් විවෘත කිරීම .*– ටෙන්ඩර්පත් භාර ගැනීමේ වේලාවෙන් පසුව ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවන්හි ටෙන්ඩර් කරුවන්ට ඒ අසල සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙක් ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් එම සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මා විසින් පවරනු ලැබූ නියෝජිතවරයෙක්ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ යුතුය.

ටෙන්ඩර් පටිපාටියට බාහිරව ඉල්ලුම් කරන ලද ටෙන්ඩර්පත් අවලංගු කරනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා තීරණය අවසාන තීරණය වේ. තවද, ටෙන්ඩර්පත් නතර කිරීමට හෝ අඑතින් ටෙන්ඩර් කැඳවීමට හෝ අවලංගු කිරීමට සම්පූර්ණ බලය ටෙන්ඩර් මණ්ඩලයට ඇත. වැඩි විස්තර සඳහා 060-2241561 දුරකථනයට කථා කර දැන ගැනීමට හැකිය.

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය,
මහ රෝහල,
වවුනියාව.

09-453

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2007 ඔක්තෝබර් මස 14 වැනි දින පෙ. ව. 9.30 ට බලපිටිය අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළදී ගනු ලබන භාණ්ඩ භාරගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිළදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ගෙන ඒම අනිවාර්යය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් විය යුතු අතර, මිළදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේදී ම ප. ව. 6.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ටි. ජී. එස්. ඒ. පෙරේරා,
මහෙස්ත්‍රාත් - බලපිටිය.

2007 අගෝස්තු මස 13 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

## උපලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|---|
| 01 | <u>ඒ. ආර්. 2934/05</u><br>පී. ආර්. 192/05 | 1. ග්‍රෑම් 5.900ක් බර ‘එම්’ අකුර සහිත රන්පාට මුදු 01යි<br>2. ග්‍රෑම් 4. 430ක් බර ‘ඩබ්’ අකුර සහිත රන්පාට මුදු 01යි |
| 02. | <u>ඒ. ආර්. 537/06</u><br>පී. ආර්. 57 | 1. මල් පෙත්තක හැඩයෙන් යුක්ත විෂ්කම්භය සෙ. මී. 6 ක ප්‍රමාණයේ යයි කියන කාන්තා රන්මුදු 01ක් සහ<br>2. සෙ. මී. 45 ප්‍රමාණයේ දිග සහිත ඩයමන් හැඩයේ රන්පාට චේන්පට |
| 03. | ඒ. ආර්. 117/90 | 1. බෝ කොළ දෙකක හැඩය ඇති රත්රන් යයි කියනු ලබන පෙන්ඩන් 01යි<br>2. අඟල් 03ක් පමණ දිග රත්රන් යයි කියනු ලබන චේන් කැබලි 01යි<br>3. අඟල් 2ක් පමණ දිග මාත්තු රත්‍රන් යයි කියනු ලබන රන් පාට චේන් කැබලි 01යි |
| 04. | <u>58082</u><br>පී. ආර්. 50 | 1. රන්පාට පොඩි කරාබු කුට්ටම් 0 1යි<br>2. අසානි වර්ගයේ කලුපාට ඩයලය සහ පටිය සහිත ක්‍රියා විරහිත පිරිමි අත් ඔරලෝසු 01යි |
| 05. | <u>ඒ. ආර්. 3259/05</u><br>පී. ආර්. 98/05 | 1. හතර වටේට කුඩා බෝල 04 බැගින් වැඩ දැමූ රන්පාට වළලු 02 |
| 06. | <u>ඒ. ආර්. 3259</u><br>පී ආර්. 99/05 | 1. රන්පාට ඉමිටේෂන් වළලු 03ක් යාකර තැනූ වළලු 01යි<br>2. රන්පාට මුදු 01යි<br>3. අඟල් 10ක් පමණ දිග රන්පාට ඩයමන් චේන් 01යි<br>4. අඟල් 16ක් පමණ දිග රන්පාට දහර චේන් 01යි<br>5. ‘මහේෂි’ යනුවෙන් ඉංග්‍රීසියෙන් කොටන ලද රන්පාට පෙන්ඩනය සහිත රන්පාට චේන් 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| | | 6. රන්පාට කාන්තා බැරල් මුදු 01යි<br>7. රන්පාට කාන්තා අත් මුදු 01යි<br>8. රන්පාට කාන්තා මුදු 01යි<br>9. බෝ කොළය හැඩැති රන්පාට ටසල් කරාබු 01යි |
| 07. | ඒ. ආර්. 3259<br>පී. ආර්. 100/05 | 1. රන්පාට ඩයමන් කට් මාල 01යි<br>2. රන්පාට කරාබු කොටස් 01යි |
| 08. | එම<br>පී. ආර්. 101/05 | 1. සුදුපාට කරාබු දෙකයි<br>2 රන්පාට දම්වැල් කැබලි 01යි<br>3. සුදු යකඩ මාල 01යි |
| 09. | ඒ. ආර්. 538/06 | 1. සෙ. මී. 6ක් විෂ්කම්භය ඇති මි. ලි. 4ක් පළල ඇති මල් කැටයම් කරන ලද කාන්තා මුදු 01ක් සහ<br>2. කැඩී වෙන්වී ඇති කොටස් දෙකකින් යුත් පිරිමි මුදු 01ක් ද සමග<br>3. මල් හැඩයකින් යුත් ඉලිප්සාකාර කොපුව රහිත පංචායුධය |
| 10. | ඒ. ආර්. 443/06<br>පී. ආර්. 96/06 | 1. මොඩල් පී. සී. ජී. 432 එන්. ජේ. ඒ. 00-0476 ජේ. පී. දරන නිල්පාට පැට් රූප් වර්ගයේ පරිගණක 01යි<br>2. ඊයම් පාට ආර්. සී. ජී. ඒ. ඩී. වී. ඩී. 51/99 දරන සී. ඩී. ප්ලේයර් 01යි<br>3. නිල්පාට අංක එස්. එන්. 392/ඒ දරන මවුස් 01යි |
| 11. | ඒ. ආර්. 782/06 | අලුපාට මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 12. | අංක රහිත | ගැලුම් 45 ප්‍රමාණයේ හිස් යකඩ බැරල් කිහිපයක් |
| 13. | 62135 | අංක 139-1124 දරන යතුරුපැදි 01යි |
| 14. | 57042 | අංක 101-5670 දරන හොණ්ඩා 90 වර්ගයේ යතුරුපැදිය |
| 15. | 59655 | අංක 118-8240 දරන යතුරුපැදිය |
| 16. | 80873 | අංක සී. 90 බී 005705 දරන යතුරුපැදිය |
| 17. | 65505 | අංක 128-5834 දරන රතුපාට හොණ්ඩා වැලි වර්ගයේ යතුරුපැදිය |
| 18. | ඒ. ආර්. 446/06 | ලියාපදිංචි නොකරන ලද ස්පිරිම් වර්ගයේ යතුරුපැදිය |
| 19. | ඒ. ආර්. 445/06 | අංක එස්. පී. එම්. සී. 4694 දරන යතුරුපැදිය |
| 20. | ඒ. ආර්. 447/06 | අංක 129-90602 ඉසඩ් ස්ට්‍රෝන් වර්ගයේ යතුරුපැදිය |
| 21. | 88273 | ඩී. වී. එස්. 125 වර්ගයේ යතුරුපැදිය |
| 22. | 54607 | අංක 107-0537 දරන යතුරුපැදිය |
| 23. | 44905 | අංක 113-2650 දරන මේට් 50 වර්ගයේ යතුරුපැදිය |
| 24. | ඒ. ආර්. 522/06 | අස්ට්‍රියා වර්ගයේ යතුරුපැදිය |
| 25. | ඒ. ආර්. 2379/05 | අංක 91 ශ්‍රී 8239 දරන යතුරුපැදිය |
| 26. | ඒ. ආර්. 781/06 | අංකය අපැහැදිලි නිල්පාට යමහා වර්ගයේ යතුරු පැදි 01යි |
| 27. | ඒ. ආර්. 13/07 | විවිධ වර්ගයේ කාන්තා අත් ඔරලෝසු 12යි |
| 28. | එම | පිරිමි අත් ඔරලෝසු 10යි |
| 29. | එම | ට්‍රිටෝක් ලෙස සඳහන් ජංගම දුරකථන 01යි |
| 30. | එම | ස්ටාර්ට් වර්ගයේ ඕපනර් 01යි |
| 31. | එම | පාවිච්චි කරන ලද කුඩ 01යි |
| 32. | ඒ. ආර්. 43/07 | කැඩී බිඳී ගිය සෝනි රූපවාහිනිය |
| 33. | අංක රහිත | තලන ලද තඹ දගර කැබලි තොගයක් |
| 34. | එම | හිස් කෑන් තොගයක් |
| 35. | එම | හිස් බූලි තොගයක් |
| 36. | එම | හිස් වීදුරු බෝතල් තොගයක් |
| 37. | එම | රබර් බට කැබලි තොගයක් |
| 38. | එම | හිරිගල් තොගයක් |
| 39. | එම | තට්ටුව දිරාපත් වී ගිය, ලී ඉරන බංකු වල සවි කර තිබූ රවුම් කියත් තලය සමග ඇක්සලය සහිත පුලි සමග වූ කියත් තල 05යි |
| 40. | එම | අංක 659505 දරන පැසිට් වර්ගයේ යතුරු ලියනය |
| 41. | එම | අංක 736019 දරන ගොඩ්රි වර්ගයේ සිංහල යතුරු ලියනය |
| 42. | එම | අංක 411668 දරන පැසිට් වර්ගයේ සිංහල යතුරු ලියනය |
| 43. | එම | අංක 140658 දරන ඔප්ටිමා වර්ගයේ යතුරු ලියනය |

09-329

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2008

2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රා තැබෑරුම් වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පලකරන ලද රා විකිණීමේ කොන්දේසි වලටද පහත සඳහන් කොන්දේසි වලටද යටත්ව 2007.10.03 දින පෙ. ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබා ගත් ප්‍රාදේශීය ලේකම්

කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි මත ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුම් අංකය සහ නම ද පැහැදිළිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල පළ කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර් කරුවන්ගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2007.10.03 වැනි දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

කිසියම් කරුණක් සඳහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාව හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2007.11.06 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

මේ වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණුම් දින පස්වරු 2.00 ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලින් මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

තමරා ඩී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය.

2007 අගෝස්තු මස 22 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | දාගොන්න-27 | දිවුලපිටිය | දාගොන්න | පෙ.ව.11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රු. 4,000 | 2007.10.03<br>පෙ.ව. 10.30 |

09-451

---

## මොනරාගල දිස්ත්‍රික්කය - බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2008 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට හා දැනට බල පවත්වන සියළුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව 2007 ඔක්තෝබර් 15 වැනි දින පෙරවරු 10.30 දක්වා මවිසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. මෙම රේන්දය නැවත විකිණීම 2007 නොවැම්බර් මස 15 දින පෙ. ව. 10.30 ට සිදු වේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත් වන අයට ටෙන්ඩර්පත් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැක. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර, මෙහි පහත ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් ඉල්ලුම් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර්පත් විවෘත කරන දිනය වන 2007.10.15 වැනි දින පෙ. ව. 10.30ට සියළුම ටෙන්ඩර්කරුවන්ට මෙම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2007.10.15 දින පෙ. ව. 10.30 ට අවසන් වේ.

05. යම්කිසි කරුණක් සටහන් නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දිනය, එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහු ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුයි.

07. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩබ්. එස්. අයි. විජේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2007 අගෝස්තු මස 06 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*2008 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව - මොනරාගල දිස්ත්‍රික්කය*

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ග්‍රාමය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පල්ලේ වරාදොල සහ ගමේවෙල ඇතුළත | පෙ. ව. 11.00 සිට ප.ව. 02.00 දක්වා නැවත ප. ව. 04.00 සිට ප. ව. 08.00 දක්වා | 500 0 | 2007 ඔක්තෝබර් 15 වැනි දින පෙ.ව. 10.30 ට |

09-598

---

## ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2008 ජනවාරි මස 01 දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ........................................ දරන ........................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත ලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2007.09.25 දින පෙ. ව. 10.30 ට පෙර ජාඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007.09.25 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2007.10.23 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඒ. විජිත ප්‍රේමශ්‍රීය,
ප්‍රාදේශීය ලේකම්,
ජාඇල.

මගේ අංකය : 1/1/7/2.
2007 අගෝස්තු මස 27 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජාඇල.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්)* |
|---|---|---|---|
| ජාඇල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2007.09.25 දින පෙ. ව. 10.30 දක්වා | 1,500 |
| එම | වැලිගම්පිටිය | එම | 1,500 |
| එම | කණුවන | එම | 4,000 |
| එම | ඒකල මෙගොඩ | එම | 5,000 |
| එම | දඬුගම | එම | 1,000 |

09-546

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනත වගන්ති ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම දැනුම් දෙන්නෙමු.

සමාගමේ නම : යුවර් ෆුඩ් ලිමිටඩ්
සමාගම් අංකය : PB 3181, 2007 ජූලි 12 වන දින
ලියාපදිංචි ලිපිනය : 451, නුවර පාර, කැළණිය.

සමාගමේ ලේකම්.

09-413/1

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනත වගන්ති ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම දැනුම් දෙන්නෙමු.

සමාගමේ නම : යුනිවර්සල් ඔටෝ ඇසෙම්බ්ලි ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : PV 60458, 2007 ජුනි 28 වන දින
ලියාපදිංචි ලිපිනය : 451, නුවර පාර, කැළණිය.

සමාගමේ ලේකම්.

09-413/2

## 2007 අංක 07 දරන සමාගම් පනත

හොරයිසන් රිලයන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී වී 60941

ඉහත සඳහන් සමාගම 2007 අගෝස්තු මස අට (08) වන දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය 99, මාදම්පිටිය පාර, කොළඹ 15 යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමු.

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2007 අගෝස්තු මස 21 වැනි දින දීය,
192, අළුත්කඩේ වීදිය,
කොළඹ 12.

09-401

## දැන්වීමයි

නොකියා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධාන අනුව 2007 ජූලි මස 2 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සිය සමාගමේ නම නොකියා සීමන්ස් නෙට්වර්ක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන නමට වෙනස් කර ඇති බව, එකී 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාර මෙයින් දන්වා සිටිනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ අළුත් නම | : | නොකියා සීමන්ස් නෙට්වර්ක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | එන් (පීවීඑස්) 47654 |
| ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය | : | 216, ද සේරම් පෙදෙස, කොළඹ 10. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

නොකියා සීමන්ස් නෙට්වර්ක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
(කලින් - නොකියා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්).

09-389

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපනය කළ බැව් මෙසේ දැනුම් දෙමු.

| | |
|---|---|
| සමාගමේ නම | : මෙකෙල් CA (පුද්.) සමාගම |
| ලියාපදිංචි අංකය | : PV 60860 |
| ලියාපදිංචි දිනය | : 2007 අගෝස්තු මස 01 දින |
| ලියාපදිංචි ලිපිනය | : අංක 170/6, අල්විස් ටවුන්, හැඳල, වත්තල. |

2007 අගෝස්තු මස 20 වැනි දින.

09-521

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වර්ෂ 1998ක් වූ මැයි මස 05 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් එහි අඩංගු කොන්දේසි සඳහා මාගේ ඇටෝර්නි බලකාරිය හැටියට වයික්කාල, තඹරාවිල පාර, "ශිරෝමි නිවස" හි පදිංචි චක්‍රවර්තිගේ මල්කා තරංගි දිල්රුක්ෂි ප්‍රනාන්දු පත් කරන්නට යෙදුන අතර, එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට බලරහිත කෙරෙන බවත් මින්පසු එකී චක්‍රවර්තිගේ මල්කා තරංගි දිල්රුක්ෂි ප්‍රනාන්දු යන අය විසින් මාගේ ඇටෝර්නි බලකාරිය හැටියට කෙරෙන කිසිම ගනුදෙනුවක් හෝ ලියවිල්ලක් නීත්‍යානුකූල නොවන බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ඇතුළු මහජනතාවට මෙයින් දන්වා සිටිනු ලැබේ.

එම්. එන්. ජේ. රංජිත් ප්‍රනාන්දු.

09-452

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වත්තල, හැඳල, ජයසිංහ පෙදෙසේ, අංක 217 දරන ස්ථානයේ පදිංචි අර්ජුන වසන්ත හරින්ද්‍ර පෙරේරා වන මා විසින් වත්තල, හැඳල, ජයසිංහ පෙදෙසේ, අංක 217 දරන ස්ථානයේ පදිංචි හෙට්ටිගේ නිම්ලිකා ක්‍රිස්ටීන් පෙරේරාට ප්‍රදානය කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් යාපා අප්පුහාමිලාගේ දොන් නෙයිල් අන්තෝනිස් විජේරත්න විසින් මෙනරපිටියගේ දොන් ඇලෝසියස් සහ තුවාම් නිසාම් හමීත් යන සාක්ෂිකරුවන් ඉදිරිපිට දී සහතික කරන ලද 1994 පෙබරවාරි මස 19 වැනි දිනැති අංක 2699 දරන ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී අහෝසිවන අතර එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

අර්ජුන වසන්ත හරින්ද්‍ර පෙරේරා.

09-427

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

"ශ්‍රී ස්ටාර්", අංක 715, දෙමටපිටිය හන්දිය, කටුනේරිය පදිංචි වර්ණකුලසූරිය වීරකුට්ටිගේ ඩොනල්ඩ් සෙබස්තියන් ශ්‍රීපති ප්‍රනාන්දු වන මම, "චූට්ටුව" මුදුකටුව, මාරාවිල පදිංචි මහර හෙට්ටිආරච්චිගේ දොන් ඇනිසිටස් ජිල්ස් ජෙමිනියස් යන අයට, මාගේ නමින් ක්‍රියා කිරීම සඳහා දෙන ලද, මාරාවිල නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. පී. ඇස්. අමරසිංහ මහත්මයා ලියා සහතික කළ, අංක 3147 සහ 2001.01.06 දින දරන ඇටෝර්නි බලපත්‍රය, අද සිට අවලංගු කොට බල රහිත කළ බවත්, එකී ඇටෝර්නි බලය යටතේ ඔහු විසින් අද සිට කරනු ලබන සියලුම ක්‍රියා මෙන් ම ගනුදෙනු ද අවලංගු වන බවත්, ඒවාට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජන රජයට සහ මහජනතාවට මෙයින් දන්වමි.

වර්ණකුලසූරිය වීරකුට්ටිගේ ඩොනල්ඩ් සෙබස්තියන් ශ්‍රීපති ප්‍රනාන්දු.

2007 අගෝස්තු මස 29 වන දින දී ය.

09 – 388

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

"ශ්‍රී ස්ටාර්", අංක 715, දෙමටපිටිය හන්දිය, කටුනේරිය පදිංචි වර්ණකුලසූරිය වීරකුට්ටිගේ සුවිනීතා ස්ටෙලා ඉන්ද්‍රාණී ප්‍රනාන්දු වන මම, "චූට්ටුව" මූදුකටුව, මාරාවිල පදිංචි මහර හෙට්ටිආරච්චිගේ දොන් ඇනිසිටස් ජිල්ස් ජෙමිනියස් යන අයට, මාගේ නමින් ක්‍රියා කිරීම සඳහා දෙන ලද, මාරාවිල නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. පී. ඇස්. අමරසිංහ මහත්මයා ලියා සහතික කළ, අංක 3148 සහ 2001.01.06 දින දරන ඇටෝර්නි බලපත්‍රය, අද සිට අවංලගු කොට බල රහිත කළ බවත්, එකී ඇටෝර්නි බලය යටතේ ඔහු විසින් අද සිට කරනු ලබන සියලුම ක්‍රියා මෙන් ම ගනු දෙනු ද අවලංගු වන බවත්, ඒවාට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජන රජයට සහ මහජනතාවට මෙයින් දන්වමි.

වර්ණකුලසූරිය වීරකුට්ටිගේ සුවිනීතා ස්ටෙලා ඉන්ද්‍රානි ප්‍රනාන්දු.

2007 අගෝස්තු මස 29 වන දින දී ය.

09 – 387

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : පමෝගා සමට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 60902
සංස්ථාගත කළ දිනය : 2007 අගෝස්තු 03
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : ලකී ඩේස් තේ කර්මාන්ත ශාලාව, බෙරලපනාතර

ලේකම්වරුන්.

09 – 327

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : ගහසිරිපුර ලලන සවිය ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 3262
සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 30
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : දොළුව ගම්පොල

ලේකම්වරුන්.

09 – 328

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය අනුව කරනු ලබන දැන්වීමයි

කෝබන් ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2007 අගෝස්තු මස 01 දින සංස්ථාගත කරන ලදී

ආයතනයේ නම : කෝබන් ෆාම්ස් (ප්‍රයිවට්) ලිමටඩ්
ආයතනයේ අංකය : පී. වී. 60853
ලියාපදිංචි ලිපිනය : අංක 77, ලෝවර් ඩිවිෂන්, ඔඩායා ගෘප්, නාරන්ගල, හාලිඇල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ඒ. සෙනවිරත්න,
සමාගම් ලේකම්.

09 – 534

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගනේමුල්ල මැද්දෙගොඩ අංක 45/5 පදිංචි මනෝරත්න ආචාරිගේ රත්න සිලි *හෙවත්* රත්න සිලි ශ්‍රී රමේස් වන මා ගලහිටියාව ගනේමුල්ල 240/B නිවසෙහි පදිංචි මනෝරත්න ආචාරිගේ රත්නමාලි යන අයට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් ගම්පහ දිස්ත්‍රික්යේ ප්‍රසිද්ධ නොතාරිස් තමරා අබේරත්න යන අය සහතික කළ අංක 521 සහ 2006.12.02 දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

මනෝරත්න ආචාරිගේ රත්නසිලි,
(605952348 V 1960.04.04).

ඇම්. ඒ. රත්නසීලි,
45/E,
මැද්දෙගොඩ,
ගනේමුල්ල.

09-540

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) පොද්දන පිටකන්ද ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3270, 2007.08.16
ලියාපදිංචි ලිපිනය : පොද්දන, පිටකන්ද, සූරියකන්ද.

අධ්‍යක්ෂ.

2007 ක් වූ අගෝස්තු මස 16 වැනි දින දී ය.

09 – 527

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ 2007 ජූලි මස 30 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඒජී, ඩීසයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P.V. 60828
සමාගමේ ලිපිනය : 21, සමගි මාවත, කඳාන

අධ්‍යක්ෂවරු.

09 – 484

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳව තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගමේ නම : සුගල් ඇන්ඩ් දමානි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්
2. ලියාපදිංචි අංකය : පී.වී. 60888
3. ලියාපදිංචි දිනය : 2007 අගෝස්තු 09
4. ලියාපදිංචි ලිපිනය : අංක 58/5, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල

සමාගමේ ලේකම්.

09 – 478

---

## ඇටර්නි බලය අහෝසි කිරීම

අම්බලන්ගොඩ බෝගහවත්ත, රෝයල් හි පදිංචි දැනට ඉතාලියේ රෝමයේ පදිංචිව සිටින එල්ලුවාහන්දි තිලකාවතී සිල්වා වන මම, ශ්‍රී ලංකා රජයටත් පොදු ජනතාවටත් අනෙකුත් සියලු දෙනාටත් දැනුම් දෙන වග නම් මා විසින් වර්ෂ 1994.04.17 දින ජේ. කේ. සුදත් ජයවර්ධන බදුල්ල කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 03 දරන ඇටර්නි බලපත්‍රය මගින් ලුණුගල බොල්ලත්තාවල, අංක 89 හි පදිංචි මුණසිංහ ආනන්ද තිස්ස කුමාර ද සිල්වා යන අයට දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරමි. මින් පසු ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය මගින් කරන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධව මම වගකීම් බාර නොගන්නා බව මෙයින් දන්වා සිටිමි.

09-585

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ ය

කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ, අංක 255/2, 1/3 ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, ලියාපදිංචි අංක GL 2005 දරන, ශ්‍රී ලංකා ජොබ්ස්නෙට් ලිමිටඩ් නමින් සමාගමක් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2007 අගෝස්තු මස 10 වන දින සංස්ථාපනය කළ බවට දැනුම් දීමයි.

අධ්‍යක්ෂවරු,
ශ්‍රී ලංකා ජොබ්ස්නෙට් ලිමිටඩ්.

2007 අගෝස්තු මස 27 වන දින,

09-524

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) හල්කඳලිය ගැමිදිරිය සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3261
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 30
4. ලියාපදිංචි ලිපිනය : හල්කඳලිය, තිවිතිගල

පී. බී. වසන්ත ඉන්ද්‍රවංශ,
සභාපති,
අධ්‍යක්ෂ.

09 – 416

---

## දැන්වීමයි

### 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි

1. සමාගමේ නම : බී එස් එස් ඉන්සයිට් එඩියුකේෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 60934
3. ලියාපදිංචි කළ දිනය : 2007 අගෝස්තු මස 07 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : 37, පළවෙනි පටුමග, ඩී මෙල් වත්ත, කොස්වත්ත, නාවල.

1. සමාගමේ නම : ජෙම් ස්ටාර් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 61024
3. ලියාපදිංචි කළ දිනය : 2007 අගෝස්තු මස 14 වැනි දින,
4. ලියාපදිංචි ලිපිනය : අංක 63, කෙයිසර් වීදිය, කොළඹ 11.

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්.

09 – 495

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 5 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2007 මැයි මස 21 වන දින සංස්ථාපනය කරන්නට යෙදුන බැව් දන්වා සිටිනු ලැබේ.

1. සමාගමේ නම : යුනිවෙස්ටර්න් ට්‍රේඩින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 60033
3. ලියාපදිංචි කාර්යාලය : අංක 41/1, කලපළුවාව, රාජගිරිය, ශ්‍රී ලංකාව

යුනිවෙස්ටර්න් ට්‍රේඩින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අධ්‍යක්ෂවරු.

දිනය : 2007 ජූලි මස 02 වන දින.

09 – 483

---

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1)ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

1. සමාගමේ නම : හමීඩ් ස්ටෝර්ස් පෞද්ගලික සමාගම
2. සමාගමේ අංකය : පී. වී. 60859
3. සංස්ථාපනය කළ දිනය : 2007 අගෝස්තු මස 01 වැනි දින
4. සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30, කළුගල්ල මාවත, කෑගල්ල

ජේ. ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම
සමාගමේ ලේකම්.

09 – 477

---

## සීමිත සමාගමක් සංස්ථාගත කිරීම සම්බන්ධයෙන් පොදු නිවේදනය

සමාගම් ආඥාපනතේ 2007 අංක 7, 9 ඡේදය යටතේ "සිවාරෝ ඉන්ටර්නැෂනල් එල්ටීඩී " සංස්ථාගත සමාගමක් ලෙස නිවේදනය කෙරේ.

1. සමාගමේ නම : සිවාරෝ ඉන්ටර්නැෂනල් එල්ටීඩී
2. සමාගම් අංකය : පී.බී. 3266
3. ලියාපදිංචි කාර්යාලය : 400, ඩීන්ස් පාර, කොළඹ 10.
4. සංස්ථාගත දිනය : 2007 අගෝස්තු මස 9

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

2007 අගෝස්තු මස 30 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

09 – 501

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) උඩදොම්ප ගැමිදිරිය සමාගම
2. සමාගම් අංකය : පී. බී. 3206
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි මස 18
4. සමාගම් ලියාපදිංචි ලිපිනය : උඩදොම්ප, හාලිඇල සමගාමි සභාපති

09-523

---

## සීමාසහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව මහජනතාව වෙත කෙරෙන නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : නිව් මැක්වීන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 60627
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 534/ **A**, කෙයිසර් වීදිය, කොළඹ 11.

එම්. ත්‍යාගරාජා,
සමාගමේ ලේකම්.

09-338

---

## 2007 වසරේ අංක 07 දරන සමාගම් පනතේ 09(1) ඡේදයට අනුව පහත සඳහන් සමාගම් පෞද්ගලික, සීමාසහිත වගකීමකින් යුතු ඒවා ලෙස නිත්‍යානුකූලව ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමු.

1. 2007 ජූලි 11 වැනි දින, සහතික අංක පී. වී. 60607 යටතේ විස්ටා ක්ලෝතින් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර එහි ලියාපදිංචි කාර්යාලය බොරලැස්ගමුව ලේක් පාරේ, අංක 472 හි පිහිටා ඇත.

2. 2007 ජුනි 21 වැනි දින සහතික අංක පී. වී. 60363 යටතේ පැරමවුන්ට් ප්‍රින්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කැලණිය පෙතියාගොඩ, දේවාල පාරේ, අංක 05 දරන ස්ථානයේ පැරමවුන්ට් නිවෙසෙහි පිහිටා ඇත.

3. 2007 අගෝස්තු 07 වැනි දින සහතික අංක පී. වී. 60932 යටතේ ස්විස් ලක්ෂරි ගෲප් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 7, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ, අංක 8ඒ දරන ස්ථානයේ පිහිටා ඇත.

4. 2007 ජුනි 12 වැනි දින සහතික අංක පී. වී. 60226 යටතේ ෆර්න්හිල් ඇසෙට්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 7, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ, අංක 8ඒ දරන ස්ථානයේ පිහිටා ඇත.

5. 2007 ජුනි මස 20 වැනි දින සහතික අංක පී. වී. 3009 යටතේ, වින් ඕෂන් ශිපින් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 13, බ්ලුමැන්ඩල් පාරේ, අංක 267 1/1 හි පිහිටා ඇත.

6. 2007 මැයි මස 30 වැනි දින සහතික අංක පී. වී. 60107 යටතේ කොමන්සෙන්ස් ඉලූෂන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූලව ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කොට්ටාව, බංගලාවත්ත, වීර මාවතේ අංක 181 හි පිහිටා ඇත.

7. 2007 මැයි මස 23 වැනි දින සහතික අංක පී. වී. 60060 යටතේ හාබර් ඉම්පෝට් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 7, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ, අංක 8ඒ දරන ස්ථානයේ පිහිටා ඇත.

8. 2007 අගෝස්තු 08 වැනි දින සහතික අංක පී. වී. 60943 යටතේ ගෝල්ඩන් මොනාක් රෙසිඩෙන්සීස් ප්‍රයිවෙට් ලිමිටඩ් නීත්‍යානුකූල ලියාපදිංචි සමාගමක් ලෙස ප්‍රකාශයට පත්කළ අතර, එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 3, ගාලු පාරේ අංක 676 දරන ස්ථානයේ පිහිටා ඇත.

කම්පැනි සෙක්‍රටරීස් ප්‍රයිවෙට් ලිමිටඩ්,
(සෙක්‍රටරීස් වූ ද කම්පැනි)
අංක 810, මරදාන පාර, කොළඹ 10.

09-378

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වයඹ සංවර්ධන බැංකුව - පොල්පිතිගම ශාඛාව

### ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

වයඹ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත, හිරියාල හත්පත්තුවේ, ඕතොට කෝරළේ කැරලන් කඩවල (කොටසක්) පන්සියගම පොල්ගහන්ගොඩ හා ගලටබැඳිවැව යන නම්වලින් හැඳින්වන ගමේ පිහිටි අක්කර එකයි, රූඩ් තුනක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ හා ගොඩනැගිලි සමඟ මා වෙත පවරන ලද බලය මත 2007.10.23 වෙනි දින පෙ. ව.11.00 දේපළ පිහිටි ස්ථානයේදී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා අත් පත්‍රිකා ඉල්ලුම් කරන්න.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.

09-395

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

රුපියල් දෙලක්ෂ දහනමදහස් තුන්සිය තිස් පහයි ශත හතලිහක මුදලක් සහ එක්ලක්ෂ පනස්නමදහස් අනූතුනයි ශත හතලිහක මුදලක් (රු. 2,19,335.40 සහ රු. 1,59,093.40) මත වර්ෂ 1999 ක් වූ ඔක්තෝබර් මස 19 වන දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 29% සියයට විසි නමය බැගින් පොලියද ව්‍යාපාරික පිරිවැටුම් බද්ද සහ ආරක්ෂක බදු සහ නඩු ගාස්තුද උසාවි වියදම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව අය කර ගැනීම පිණිස අංක 09 කෙලින් වීදිය මහව වසන ගම්මැද්දේ හේරත් මුදියන්සේලාගේ හරිස්චන්ද්‍ර චන්දිමට විරුද්ධව සේලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ් අංක 69 ජනාධිපති මාවත කොළඹ 1 විසින් කොළඹ දිසා අධිකරණයේ පවරන ලද අංක 17268/උකස් දරන නඩුවෙන් මා වෙත නිකුත් කරන ලද නියෝගය මා වෙත පවරා දී ඇති බලතල අනුව වර්ෂ 2007.10.12 වන දින පෙ. ව. 11.30 කනිසමට අංක 09 කෙලින් වීදිය මහව යන ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ පහළ විසිදෙකේ කෝරළේ නෙත්තිපොලගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සම්පාදිත 1998.06.15 දින අංක 57/88 දරන සැලැස්මයේ පෙන්නුම් කෙරෙන හබයාගේ මූකලාන නොහොත් තෙක්කවත්ත (අංක 388543 දරන හිමිකම් පිඹුරේ අනු බෙදීමක් වන) නමැති ඉඩමේ ලොට් 14 දරන උතුරට : මහව සිට මොරගොල්ලාගම දක්වා වන මහ පාරද ; නැගෙනහිරට : ඉහත කී සැලැස්මයේ ලොට් 152; දකුණට : කෝන්ඹය සහ බස්නාහිරට : ඉහත කී සැලැස්මයේ ලොට් 13 ද මායිම් වූ ඉහත කී සැලැස්මය ප්‍රකාරව අක්කර එකයි පර්චස් තුනක් (අ. 1, රූ. 0, පර්. 03) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන්කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල සහ එහි තුල ගොඩනැගිලි ගස්කොල සහ සියලු දේත් සමග වේ. නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 33/7හි ලියාපදිංචි කර ඇත.

ඉහත අංක 57/88 දරන සැලැස්මයේ ඉහත කී ලොට් 14 මැනකදී කරන ලද මැණුමක් අනුව පහත සඳහන් ලෙස විස්තර වේ :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ පහළ විසිදෙකේ කෝරලේ නෙත්තිපොලගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සම්පාදිත 1990.01.16 දින අංක 316/90 දරන සැලැස්මයේ පෙන්නුම් කෙරෙන හබයායේ මුකලාන *නොහොත්* තෙක්කවත්ත (අංක 388543 දරන හිමිකම් පිඹුරේ අනු බෙදීමක් වන) නමැති ඉඩමේ ලොට් 14 දරන උතුරට : මහව සිට මොරගොල්ලාගම දක්වා වන මහ පාරද නැගෙනහිරට ලොට් 15 ද ; දකුණට : කෝන්ඹය සහ බස්නාහිරට : ඉහත කී සැලැස්මයේ ලොට් 13 ද මායිම් වූ එකී අංක 316/90 සැලැස්මය ප්‍රකාරව අක්කර එකයි පර්චස් තුනක් (අ. 1, රූ. 0, පර්. 03) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන්කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල සහ එහි තුළ ගොඩනැගිලි ගස්කොල සහ සියලු දේත් සමග වේ.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නිහත්පත්තුවේ පහළ විසිදෙකේ කෝරලේ නෙත්තිපොලගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සම්පාදිත 1996.12.10 දින අංක 3253/96 සහ බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් සම්පාදිත 1980.06.15 දින අංක 57/88 දරන සැලැස්මයේ පෙන්නුම් කෙරෙන හබයායේ මුකලාන නොහොත් තෙක්කවත්ත (අංක 388543 දරන හිමිකම් පිඹුරේ අනු බෙදීමක් වන) නමැති ඉඩමේ ලොට් 14ජී දරන උතුරට: නිකවැරටිය සිට මොරගොල්ලාගම දක්වා වන මහ පාරද ; නැගෙනහිරට : පී. එච්. එම්. රූපශාන්ති කුමාරිහාමිට අයත් ඉහත කී අංක 57/88 දරන සැලැස්මයේ ලොට් 15 ; දකුණට : කෝන්ඹය සහ බස්නාහිරට : අංක 57/88 සැලැස්මයේ පී. එච්. එම්. හේමමාලිනි කුමාරිහාමිට අයත් ලොට් 13 ද මායිම් වූ රූඩ් එකයි පර්චස් විසිපහක් (අ. 0, රූ. 1, පර්. 25) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන්කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල වේ.

*දේපළට පිවිසිය හැකි මාර්ගය.-* මහව මදගල්ල පාරේ සැතපුම් 1/2ක් පමණ ගිය විට කි. මී. 21 කණුව සිට යාර 100ක් පමණ ඉදිරියට ගිය විට අදාල ඉඩම පාරේ දකුණු පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–*වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය :

1. 25% ගැණුම් මුදලින් ද,
2. 1% පළාත් පාලන ආයතන ගාස්තු සහ වැට් බද්ද ද,
3. 2 1/2% විකුණුම් මුදලින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 75% මුදල ඉහත සඳහන් නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා සේලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ් අංක 69 ජනාධිපති මාවත කොළඹ 1 - දුරකථන අංකය : 5511357.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ
දුරකථන අංකය : 2863121

09-454/2

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 8 වන වගන්තිය යටතේ අගනා දේපලක් වෙන්දේසියේ විකිණීම

අංක 8972 දරන බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල ; මධ්‍යම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පහත හේවාහැට ගම්දහය කෝරලේ දකුණේ, බූටාවත්තේ පිහිටි, මහනුවර බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් විසින් මැන සාදන ලද වර්ෂ 1946 ක් වූ පෙබරවාරි මස 04 වන දින සහ ඔක්තෝම්බර් මස 02 වැනි දිනැති අංක 377/100 දරන පිඹුරේ සලකුණු කොට දැක්වෙන නිකතැන්න වත්තේ බෙදා වෙන්කරන ලද බිම්කොටස් ලොට් අංක 3, 4, 5 සහ 6 ප්‍රමාණය අක්කර දෙකයි, රූඩ් තුනයි , පර්චස් දහතුනකි. (අ. 2, රූඩ් 3, පර්. 13) බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර නැවත මැනීමකින් සාදන ලද අංක 329 හා 1986 ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ අංක 1 ලෙස පෙන්වා ඇති බිම් කට්ටිය, වර්ෂ 1946 ක් වූ පෙබරවාරි මස 4 වන දින සහ ඔක්තෝම්බර් මස 02 වන දින බලයලත් මින්දොරු පී. ස්පෙන්සර් විසින් මැන සාදන ලද අංක 377/100 දරන පිඹුරේ සඳහන් බූටාවත්තේ පිහිටි නිකකැන්න වත්තේ 3, 4, 5 සහ 6 බිම් කට්ටි නිරූපිත වන අතර ප්‍රමාණය අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් තිහක් වේ. (අ. 2, රූඩ්. 3, පර්. 30) එමෙන්ම බලයලත් මිනින්දෝරු එම්. ඩී. බී. වැත්තැව ඉහත සඳහන් ඉඩම නැවත මැණීමකින් 2005 ක් වූ මාර්තු මස 17 වන දින මැන සාදන ලද අංක 3437 දරන පිඹුරේ අක 1 බිම් කට්ටිය, බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර විසින් මැන සාදන ලද 1986 ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරු අංක 329 සඳහන් අංක 1 වශයෙන් සඳහන් කර ඇති බිම් කට්ටිය වශයෙන් විස්තර කර ඇත.

ප්‍රමාණය : අ. 2, රූ. 03, පර්. 30 (අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහයි). (එහි තුළ ඇති ගොඩනැගිලි වැව්ලි සහ වෙනත් දේ සමග වේ.) මාතලේ මයලාගු ෂෂීකරන් විසින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙතට උකස් කරන ලද දේපල නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2007 ක් වූ ඔක්තෝම්බර් මස 05 වන දින පෙ. ව. 11.00ට ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–*විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එක (1%) ක්ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ක් ද ;
4. නොතාරිස් ගාස්තු රු. 2000 ක් ද ;
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් ද ;
6. සියළුම ප්‍රචාරක වියදම්ද,

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත්කළ දින සිට දින 30ක් ඇතුලත දී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි නීති නිලධාරී අමතන්න. දුරකථන අංකය : 011-4313158.

ගාමිණී බී. එස්. දියාව,
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු.

අංක 247, ප්‍රීතිපුර පාර, පල්ලිය වත්ත, හැඳල, වත්තල
දුරකථන අංකය : 0777-281723

09-499

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - තලංගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. මොහොට්ටි විසින් සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූද 2005.05.27 වන දින සහ අංක 2753 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෝට්ටේ ආචාරිගේ නෙල්සන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/ස හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 සැප්තැම්බර් මස 28 වන දින ප. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල ඒකකයේ තලංගම උතුර කඩුවෙල පාර දිගට පිහිටි වරිපනම් අංක 442/6 දරන බෝගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. ටී. ඒ. දිසානායක විසින් මැන සාදන ලද 2004.08.22 දිනැති අංක 2664 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 1 දරන ඉඩම සහ ඉහත කී අංක 2753 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමඟ වේ. විශාලත්වය.–පර්චස් 12.59 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.15 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.07.10 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක්ද ;
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක්ද
5. සියළුම ප්‍රචාරක වියදම් ;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක්ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම)
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474 පිටකෝට්ටේ
කෝට්ටේ
දුරකථන අංක : 2863121

09-454/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - පුත්තලම ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### 1 වැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු යටිකහ කෝරලේ හත්පත්තුවේ කටුගම්පල ලබ්බයාය ගමේ පිහිටි (බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 1999.08.19 දිනැති අංක 5845 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 සහ 2 හි එකතු කිරීමක් වන) බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 2000 මැයි මස 10 දිනැති අංක 6125 දරන සැලැස්මේ පෙන්නුම් කරන මහනුගලන්ද වත්ත නැමැති ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් හතයි දශම අටයි පහක් (අ. 0 රූ. 1 පර්. 7.85) (හෙක්ටයාර් 0.12102) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය / පත්ඉරුව ජේ 122/188 හි ලියාපදිංචි කර ඇත.

### 2 වැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, යටිකහ කෝරලේ දකුණු හත්පත්තුවේ කටුගම්පල කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ බෝහිංගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සාදන ලද 1999.03.14 දිනැති අංක 2354 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහනුගලන්ද එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 8 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් තිහයි දශම අටක් (අ. 0 රූ. 0 පර්. 30.8) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ. 120/131 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) පෙර කී බෝහිංගමුව පිහිටි පෙර කී අංක 2354 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහනුගලන්ද එස්ටේට් නැමති ඉඩමේ කැබලි අංක 13 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් තිස්පහක් (පර්. 35) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ. 120/129 යටතේ ලියාපදිංචි කර ඇත.

එහි අංක 2354 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අංක 4 සහ 6 ලකුණු කළ මාර්ග සඳහා වෙන්කිරීම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග මෙම දේපල පුත්තලමේ (සහතික අංක 38 - 269) මහවැලි කොන්ක්‍රීට් වර්ක්ස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුත්තලමේ පදිංචි කෝරාල ගමගේ ආනන්ද මහීපාල පෙරේරා යන අය බන්දනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2007 ඔක්තෝබර් මස 09 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*– 1 වැනි උපලේඛනයේ ඉඩම - කුලියාපිටිය නගර මධ්‍යයේ සිට නාරම්මල පාරේ කි. මී. 2.1ක් ගිය විට අදාල දේපළ දකුණු පස පිහිටා ඇත.

2 වැනි උපලේඛනයේ ඉඩම.– නගර මධ්‍යයේ සිට කුරුණෑගල පාරේ කි. මී. 2.6 (නගර සභා සීමාව පසුකර මීටර් 50ක්) ගොස් දකුණට ඇති අඩි 10 පුද්ගලික පාරේ මීටර් 110ක් ගිය විට ඉඩමට පිවිසිය හැක. මෙම පාරේ මැද කොන්ක්‍රීට් ලයිට් කණුවක් ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2007.06.22 වැනි දින ද ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත් වල 2007.06.14 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2007.06.16 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. 1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්); 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්); 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්); 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000; 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500; 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක : 50/3, විහාර මාවත.
කොලොන්නාව.

දුරකථන අංක : 011-2696155, 011-2572940

09-496

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - වැලිමඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 2002.09.23 සහ 2004.08.30 දින සහ පිළිවෙලින් අංක 11161 සහ 12645 දැන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දේවකැල්ලේ ගෙදර හීන් බණ්ඩා යන අය ණයකරු හැටියට ද ඒකනායක මුදියන්සේලාගේ නන්දසිරි ණයකරු හා උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2007 ඔක්තෝබර් මස 02 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩ පළාත කෝරළේ වීදුරුපොළ ගමේ පිහිටි "ගෙදර වෙල්ලවත්ත" නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක එස්. අලහනායක විසින් 2000.04.04 වැනි දින මැන සාදන ලද අංක 103 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම සහ ඊට අයත් නිවස සහ එහි සියලු දේත් සමග වේ.

විශාලත්වය පර්චස් 21.9යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.27 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.11.09 වැනි දිනැති අයිලන්ඩ් දිවයින පුවත්පත් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියට එක (1%)ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%)ක් ද ;
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ද වේ. ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ 12.

09-494

## කඳුරට සංවර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත වතුරකුඹුර හි පිහිටි කුරුගම එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. හේරත් මහතා විසින් 1965.02.03 සහ 1965.07.11 දිනයන්හි මැන සාදන ලද අංක 1559 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 දරන අක්කර පහයි පර්චස් තුනක් (අක්. 05, රූ. 0 පර්. 03) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේත් ද, කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අප වෙත පවරා ඇති බලය මත 2007 ඔක්තෝබර් මස 03 වන බදාදා දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම ඉඩම කඳුරට සංවර්ධන බැංකුවට උකස් කර ඇත්තේ එච්. එම්. අශෝක රංජිත් විජේරත්න යන අය විසින් ය.

වැඩි විස්තර සඳහා 2006.04.25 වැනි දින දිනමිණ, තිනකරන් සහ ඩේලිනිව්ස් පුවත්පත් සහ 2005.08.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයත්* බලන්න.

*ගෙවීමේ පිළිවෙල.–* ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ මුදලින් පහත ගෙවීම් කළ යුතුය.

1. විකුණුම් මිළෙන් 25% ;
2. ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු විකුණුම් මිලෙන් 1% ;
3. වෙන්දේසිකරුගේ ගාස්තුව විකුණුම් මිලෙන් 2.5% ;
4. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
5. ලිපිකාර හා සෝෂක ගාස්තු රු. 500 ;
6. නොතාරිස් ගාස්තු රු. 3,000.

ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කඳුරට සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂාවට හා වැඩි විස්තර සඳහා මහනුවර, කටුගස්තොට පාරේ, අංක 130 හි පිහිටි කඳුරට සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලය විමසන්න.

දුරකථන අංක: 081-2214122 ෆැක්ස් අංකය : 081-214123.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත ISO 9W : 2WO සහතිකලත් පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක: 081-2227593
ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : Schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය හා වෙන්දේසි ශාලාව :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011 - 2585408
ෆැක්ස් අංකය : 011 - 2588176
ඊමේල් : Schokman@samera 1892.Com.

09-489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.